www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප හතර වන ජාත්‍යන්තරය පිහිටුවීමේ 70 වන සංවත්සරය සැමරීමට යයි

## Sri Lankan SEP to commemorate 70th anniversary of the founding of the Fourth International

**2008 නොවැම්බර් 22**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) හතර වන ජාත්‍යන්තරය පිහිටුවීමේ 70 වන සංවත්සරය සමරනු වස් නොවැම්බර් 27 දා ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත.

ලියොන් ට්‍රොට්ස්කි විසින් 1938 දී හතර වන ජාත්‍යන්තරය පිහිටුවන ලද්දේ 1929 වෝල් වීදියේ කොටස් වෙළඳ පොලේ කඩාවැටීම මගින් අවුලුවන ලද මහා අවපාතය මධ්‍යයේ ය. ට්‍රොට්ස්කි 1933 දී නව ජාත්‍යන්තරය සඳහා කැඳවුම් කලේ, ජර්මනියේ නාසින් බලයට පත්වීමට පාර කැපූ සෝවියට් සංගමයේ ස්ටැලින්වාදී නිලධරයේ පාවාදීම්වලට පසුව ය.

1938 දක්වා වූ පස් වසර තුල, ට්‍රොට්ස්කි, ස්ටැලින් විසින් අතහැර දමනු ලැබ තිබූ සමාජවාදී ජාත්‍යන්තරවාදයේ ක්‍රියාමාර්ගයේ පදනම මත හතර වන ජාත්‍යන්තරයේ ආරම්භක කේඩර රැස් කිරීමේ හා ඔවුන් අධ්‍යාපන ගත කිරීමේ දේශපාලන අරගලයක වෙහෙස නොතකා නිරත විය. කම්කරු පන්තිය මුහුන දී සිටියේ මහජන විරැකියාවේ හා දරිද්‍රතාවයේ ව්‍යසනයන්ට, ෆැසිස්ට්වාදයේ නැගීමට සහ යුද්ධයේ අන්තරායට ය.

හතර වන ජාත්‍යන්තරයේ පාදක ක්‍රියාමාර්ගය මෙසේ අනතුරු ඇඟවීය: "ඊලඟ ඓතිහාසික කාල පරිච්ඡේදය තුල, සමාජවාදී විප්ලවය සිදු නොවුව හොත්, මානව වර්ගයාගේ සමස්ත සංස්කෘතියම විනාශ වීමේ තර්ජනයට මුහුන දී සිටී. දැන් වාරය එලඹ ඇත්තේ කම්කරු පන්තියට ය, ප්‍රධාන වසයෙන් ම එහි විප්ලවවාදී පෙරටු බල ඇනියට ය. මානව වර්ගයාගේ ඓතිහාසික අර්බුදය විප්ලවවාදී නායකත්වයේ අර්බුදය බවට ලඝු කෙරී ඇත." ඉන් වසරක් ගත වීමටත් පෙරාතුව, ලෝකය දෙවන ව්‍යසනකාරී ගෝලීය යුද්ධයක් තුලට ඇද දැමුනි.

යලිත් වරක්, මානව වර්ගයා ව්‍යසනයක් දෙසට ඇද දමමින් තිබේ. ධනවාදයේ ප්‍රතිවිරෝධතා මූල්‍ය අර්බුදයක් ද 1930 ගනන්වලින් මෙපිටට අත් නොදැකි පරිමානයේ ගෝලීය ආර්ථික පසුබැස්මක් දෙසට ඇද වැටීමක් ද නිර්මානය කර ඇත. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ඓතිහාසික කඩාවැටීම, දකුනු ආසියාව ඇතුලු පෘථිවි ගෝලයේ සෑම කොටසක් ම අස්ථායි කරමින් පවතින නව-විජිතවාදය සහ මිලිටරිවාදය පැන නැගීමට තුඩු දී තිබේ. ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ දැන් පවතින යුද්ධ එලඹීමට නියමිත වඩා දැවැන්ත ගැටුම් පිලිබඳ කල්තියා කෙරෙන අනතුරු ඇඟවීම් ය.

යලිත් වරක්, දවසේ දැවෙන ප්‍රශ්නය විප්ලවවාදී නායකත්වයේ අවශ්‍යතාව ය. නව කාල පරිච්ඡේදයේ අභියෝගයන්ට මුහුන දෙනු පිනිස නැගී සිටීමේ දී, කම්කරුවන්, තරුනයන් සහ බුද්ධිමතුන් හතර වන ජාත්‍යන්තරයේ අරගල තුල දේහානුරූප වී පවතින පසුගිය සියවසේ දේශපාලන පාඩම්වලින් සන්නද්ධ වීම අවශ්‍ය ය. සමාජවාදී අනාගතයක් උදෙසා සටන් කරනු පිනිස, යමෙක් අතීතයේ කම්කරු පන්තියේ විප්ලවවාදී මාවත අවහිර කල බාධක ජය ගත්තේ කෙසේද යන වග අවබෝධ කර ගත යුතු ය.

හතර වන ජාත්‍යන්තරය පිහිටුවීම සමරන අපගේ ප්‍රසිද්ධ රැස්වීමට සහභාගි වන ලෙස කම්කරුවන්ට හා තරුනයන්ට සසප සහ සසජාශි උනුසුම්ව ආරාධනා කරමු.

**දිනය සහ වේලාව:** නොවැම්බර් 27 සවස 4.00

**ස්ථානය:** කොලඹ, මහජන පුස්තකාල ශ්‍රවනාගාරය

**ප්‍රධාන කථිකයා:** සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්

© www.wsws.org